# බුදු දහම සහ අනාත්මවාදය

ගරු තලල්ලේ ධම්මානන්ද නාහිමි

බුදු දහම සහ අනාත්මවාදය යන මැයෙන් කථාව අරඹන්නට පෙර ආත්මවාදය පිළිබඳ යමක් ප්‍රකාශ කළ යුතුය යි සිතමි. ආත්මවාදය පිළිගෙන ඇත්තේ බෞද්ධ දර්ශනයෙන් පරිබාහිර අන්‍ය දාර්ශනිකයන් විසිනි. ආදි ම මිනිස්සු තමන් කිසියම් සර්වබලධාරී දෙවියකුගේ මැවීමකැ'යි ඇති කර ගත් විශ්වාසයට අනතුරුව මෙසේ සිතන්නට වූහ : 'තමන් තුළ සිතීම, විඳීම, හැඳිනීම, සිහි තබා ගැනීම ආදිය කරන කෙනෙක් වෙති. ඒ ආත්මයයි. මේ සියල්ල අතිදීර්ඝ කාලයක සිට පහළ වෙමින් වෙනස් විය. වෙනස් වෙමින් ආ ඒ මත සියල්ල දැනට ඇති කරුණු අනුව අපට දැන ගත හැකි නොවෙයි.

මහාභාරතය හා උපනිෂද් ග්‍රන්ථයන් ඇසුරෙන් එබඳු මත ස්වල්පයක් රැස් කරගත හැකිය. 'මිනිසා යාම ඊම ආදී ක්‍රියා කරන්නේ ඔහු තුළ සැඟවී පවත්නා ආත්මය නිසාය'යන විශ්වාසය ඉතා පැරණිය. ආත්මය ප්‍රමාණයෙන් යව ඇටයක් තරම් වෙයි. 1 (1. බෘහදාරණ්‍යක උපනිෂද්) පසුව එය මාපටැඟිල්ලක ප්‍රමාණයෙන් යුත් මිනිස් සටහන් ඇත්ත.කැයි ද, දුම් පැහැති බැටළු ලොම් ගුළියක් හෝ ගිනිසිලක් හෝ හෙළපියුමක් හෝ විදුලියක් හෝ දුම් රහිත ගින්නක් හෝ බඳුයැයිද නොයෙක් දෙනා විසින් කියන ලදී.

' ආත්මන් ' යන වචනය අතිපුරාණ වෙදසූක්තයන්හි දැක්ක හැකිය. එහෙත් ඒ වචනයෙහි නිෂ්පත්තිය අවිනිශ්චිතය. 'අත්' ධාතු කෙරෙන් 'මණින්' ප්‍රත්‍යය ව සිද්ධ පදයක් ලෙස තර්කවාචස්පතීහු දක්වති. එහි අදහස හුස්මය යි ඇතැම් තැනක කියැවේ. එබඳු අදහසක් ඇතිකර ගැනීමට මූල් වන්නට ඇත්තේ දඩයම් යුගයෙහි මිනිසුන් මුගුරු ආදියෙන් සතුන්ට තළා එයින් උන් බිම වැටී කටින් හුස්ම හෙළන සැටිත්, අවසන් හුස්ම හෙළූ පසු නිශ්චලව අප්‍රාණික වූ සැටිත් බලා ඒ කටින් පිටව ගියේ ඇතුළත පැවති ප්‍රාණ වායුව හෙවත් හුස්මය යි ඇති කර ගත් අදහසින් විය හැකිය. මෙහි හුස්ම යන අදහස යොදා තිබෙන්නේ ''ප්‍රාණය''යන අර්ථයෙනි. අත්‍යර්ථසත්‍යය වූ පදාර්ථය ආත්මයයි 'ආත්මන්' ශබ්දයේ තවත් ගැඹුරු අදහස් ද දක්නට ඇත. මේ ප්‍රාණය හෝ ආත්මය ශරීරය අත්හැර ගොස් නැවතත් ශරීරයට ම පැමිණිය හැකි කිසියම් දෙයක් ලෙස සැලකේ. මනස් යනුවෙන් ඍග් වෙදයෙහි සඳහන් වන්නේ එයයි. (2. ඍග්වෙද × 58 සූක්ත) අවිඥානික පුරුෂයකුගේ ආත්මය නැවත ශරීරයට ගෙන්වා ගනු සඳහා යෙදූ මන්ත්‍රයක් ද මෙහි ඇත. (ඍග්වෙද– කෝපන්හේගන් 1919) සිහින පෙනෙන තරම් වූ නින්දෙහි දී ආත්මය සිරුරෙන් පිටව යන බවත්, එසේ පිටව ගිය ආත්මයට ආපසු හැරී ඒමට ඉඩ නොදී නිදා සිටින්නකු හදිසියෙන් පිබිදෙව්වොත් ඔහුට වැළඳෙන රෝගයට ප්‍රතිකාර කරනු දුෂ්කර බවත් ඇතැමෙක් ප්‍රකාශ කරති.

නින්දෙහි දී සිරුරෙන් පිට වී තමනට රිසි සේ හැසිරෙන ආත්මය තමන්ගේ කැමැත්ත පරිදි ගඞ්ගාපොකුණු ආදියෙන් යුත් ලෝකයක් මවා ගෙන එහි ක්‍රීඩා භූමි සභ්‍යා ගෙවල් හා රථවාහන ආදියද මවා ස්ත්‍රීන් හා සතුටු වෙමින්, මිත්‍රයන් හා සිනාසෙමින්, භයානක දේවල් දකිමින් හැසිර වෙහෙසවැ තමන් සිරුර තුළට ආපසු ඒ යයි තවත් සමහරු විශ්වාස කළහ.

## මරණයේ දී ආත්මය සිරුරෙන් පිටව යන හැටි

මරණයේදී ආත්මය සිරුරෙන් පිටවැ යන සැටි දැක්වෙන්නේ මෙසේය. ' සාමාන්‍ය මනුෂ්‍යයකු මැරෙන විට ඔහුගේ හෘදයවස්තුවෙහි උඩ කොටස ආලෝකවත් වෙයි. ඒ ආලෝකයෙන් මග පෙන්වනු ලබන ආත්මය හෘදයෙන් ඈස කරා ගොස්, ඇසින් පිටවී අන්‍ය ශරීරයකට ඇතුළු වෙයි. එසේ ඇතුළු වන ශරීරය මැරුණු පුද්ගලයාගේ කුශලාකුශල කර්මයන් අනුව උසස් හෝ පහත් විය හැකිය. ආශාව ප්‍රහාණය කළ පුද්ගලයාගේ ආත්මය හිස් මුදුනින් පිටවී ' බ්‍රහ්මන් ' හෙවත් ' පරමාත්මන් ' වෙත ගමන් කරයි. ඇතැම් පින්වත් මිනිසුන්ගේ ආත්මය සඳ වෙත ගිය විට එහි වැසී

දෙවියනට ආහාර වෙයි. ඔවුන්ගේ පින් ගෙවුණු පසු ඒ ආත්මයෝ දෙවියන් කෙරෙන් ආකාශ ධාතුවට ද, ආකාශධාතුවෙන් වාතයට ද, වාතයෙන් වර්ෂාවට ද, ඇතුළු වී වැස්ස මගින් පොළොවට පැමිණෙත්. පොළොවෙහි දී මිනිසුන්හට ආහාර වන වෘක්ෂලතාවනට ඇතුළු වෙති. ඒ වෘක්ෂලතා මගින් පුරුෂශරීරයන්ටද, පුරුෂශරීරවලින් ස්ත්‍රීශරීරයන්ට ද ඇතුළු වෙතැයි ඡාන්දෝග්‍යඋපනිෂද් ආදියෙහි දැක් වේ. 3. (3. ලෝකයෙහි ඇති කුඩා දෙයත්, ඉතා විශාල දෙයත් ආත්මයයි. " මාගේ හෘදයෙහි පවත්නා මගේ ආත්මය ධාන්‍යබීජයකට වඩා, යව ඇටයකට වඩා, මෙනේරි ඇටයකට වඩා, තණඇටයක සාරයට වඩා, කුඩාය. මගේ හෘදයාභ්‍යන්තරයේ පවා මේ මාගේ ආත්මය පෘථිවියට වඩා විශාලය, අභ්‍යවකාශයට, අවකාශයට වඩා විශාලය. මේ ලෝකවලට වඩා විශාලය. සියලු ම ක්‍රියාවන්ගෙන්, සියලුම ආශාවන්ගෙන්, සියලුම ආඝ්‍රාණයන්ගෙන්, සියලු ම රසයන් ගෙන් සංයුක්තව සියල්ල වැළඳ ගෙන සිටින්නා වූ මාගේ හෘදයාභ්‍යන්තරයෙහි තිබෙන මේ මාගේ ආත්මය මෙය බ්‍රහ්මය. 2. (2 ඡාන්දෝග්‍ය උපනිෂද්)

## පරමාත්මන්

මෙසේ විවිධ ආත්මයන් ගැනත්, විවිධ දෙවිවරුන් ගැනත් ඇදහීම් ඇති වීමෙන් පසු " මේ සියලු ආත්මයෝ ද, සියලු දෙවිවරු ද, එක් ආදිම ආත්මයකින්, සර්වව්‍යාපී ආත්මයකින්, පරමාත්මයකින් හටගත්හ" යන මතය ඇති කර ගන්නා ලදී. ඉක්බිතිව වෙන් වෙන් වශයෙන් පවත්නා ජීවාත්මයන් පරමාත්මයට ඇතුළු වන තුරු ඔවුන් සකිලිටිය යන ද්වෛතවාදය ද, ඒ පරමාත්මය හා සත්ත්වයන් තුළ පවත්නා ආත්මයන් (ජීවාත්මන්) අතර වෙනසක් නැත්තේය යන අද්වෛතවාදය ද උපදවන ලදහ. ආත්මවාදය මින් එහා ගෙන යාමෙහි කිසිවකු සමත් වූ බවක් නො පෙනේ. භගවත්ගීතාවෙහි ආත්මන් ගැන කියා ඇති දෙය ද මෙහි ලා සලකා බැලීම උචිතය.

" යම් සේ ජීවාත්මයට සම්බන්ධ වූ මේ සිරුරෙහි ළදරුබව යොවුන්බව හා ජරාව යන මෙ සියල්ල වේද, එසේ ම ඒ ජීවාත්මයාගේ අන්දේහයකට පැමිණීම ද සිදු වේ. එහි නුවණැතියා මුළා නොවේ." 4.

(4) දේහිනෝස්මින් යථා දේහෝ
කෞමාරං යෞවනං ජරා,
තථා දේහාන්තරප්‍රාප්තිර්
ධීරස්තත්‍ර න මුහ්‍යති. (භගවත්ගීතා. 2 අධ්‍යාය 18 ගීත)

" යමෙක් ආත්මය විනාශ වන්නකැයි සිතා ද, යමෙක් මෙය නසනු ලබන්නකැයි සිතා ද, ඒ දෙදෙන ම සත්‍යය නො දන්නෝ වෙත්. මේ ආත්මය නො මැරේ. මැරිය හැක්කක් ද නො වේ."

5. (5) ය ඒනං වේත්ති හන්තාරං
යශ්චෛනං මන්‍යතේ හතම්
උභෞ තෞ න විජානීතෝ
නායං හන්ති න හන්‍යතේ. (භගවත්ගීතා. 2 අධ්‍යාය. 19 ගීත)

" මේ ආත්මය කිසි කලෙකත් නූපදී, එසේ ම නො මැරේ. මෙය ඇති වී නැවත හට ගත්තක් ද නොවේ. මෙය නූපදී. නිත්‍යව ස්ථිරව පුරාණ තත්ත්වයෙන් ම පවතී. ශරීරය නසනු ලබන කල්හි දු මෙය නො මැරේ." 6.

(6) න ජායතේ න ම්‍රියතේ වා කදාචිත්
නායං භූත්වා භවිතා වා න භූය ඃ
අජෝ නිත්‍යං ශාස්වතෝයං පුරාණෝ
න හන්‍යතේ හන්‍යමානේ ශරීරේ. (භගවත්ගීතා. 2 අධ්‍යාය. 20)

" මිනිසා පැරණි වස්ත්‍ර ඉවත ලා අලුත් වස්ත්‍ර හැඳ ගන්නා සේ ජීවාත්මය පැරණි සිරුරු හැර දමා අලුත් සිරුරු ලබා ගනී." 7.

(7) වාසාංසි ජීර්ණානි යථා විහාය
නවානි ගෘහ්ණාති නරෝ' පරාණි
තථා ශරීරාණි විහාය ජීර්ණාන්
න්‍යන්‍යානි සංයාති නවානි දේහී. (භගවත්ගීතා. 2 අධ්‍යාය. 22)

" මේ ආත්මය නො සිඳිය හැක්කේය. නො දැවිය හැක්කේය. තෙත් කළ නො හැක්කේය. වියලිය නො හැක්කේය. මෙය ම නිත්‍යය. හැම තැන පැතිර පවතී. අචලය. ස්ථිරය. සනාතන ද වේ." 8

(8) අච්ඡේද්‍යෝ'යමදාහ්‍යෝ'යමක්ලේද්‍යෝ'ශෝෂ්‍ය ඒව ච
නිත්‍ය : සර්වගත : ස්ථාණුරචලෝ'යං සනාතන : (භගවත්ගීතා. 2 අධ්‍යාය. 24)

බාහිරකයන් දුටු ආත්මයෙහි තතු මෙ බඳු බව පළමු කොට ම සිත තබා ගත යුතුය.

### ෂට්ශාස්තෘවාද

මිලභට බුදුරජාණන් වහන්සේ ලොව පහළ වන කාලයෙහි මෙ ආත්මවාදය දඹදිව විසූ ඇතැම් දර්ශනිකයන් විසින් විවිධ ස්වරූපයෙන් ඉදිරිපත් කොට ඇති අයුරු විමසා බැලීම උචිත යි සිතමි.

### 1. පූරණකස්සපවාදය

පූරණකස්සප අක්‍රියවාදියෙකි. 1 (1. දීඝනි. සාමඤ්ඤඵල, සීලක්ඛන්ධවග්ග 39) සත්ත්ව සමූහයා එක ම මස්ගොඩක් වන සේ ලියා ලුව ද කො පමණ දානාදි සුචරිත ක්‍රියාවන්හි හැසිරුන ද එයින් පවක් හෝ පිනක් නො වන බව ඔහුගේ ඉගැන්වීමයි.

" කරවන්නා ද කරන්නා ද සියල්ල කරන්නෙක් නො වේ. මෙසේ ආත්මය අකාරකයි. 9

(9) කුව්වඤ්ච කාරයඤ්චේච
සව්වං කුව්වං න විජ්ජඉ
ඒවං අකාරඋ අප්පා (සූයගඩඞ්ග) 1.1.1.13)
කුර්වන්ශ්ච කාරයන්ශ්චෛව
සර්වං කුර්වන් න විද්‍යතේ
ඒවං අකාරක ආත්මා. (සංස්කෘතඡායා)

මොහුගේ මතයට අනුව ආත්මය පින් පව් කිසිවක් නො කරන නිෂ්ක්‍රිය දෙයකි. ආත්මය විඳින්නෙක් ද නො වේ. පරම තත්ත්වය කුසල් අකුසල් දෙක ඉක්මවා සිටියි. සියල්ල ඉබේ හට ගනී යනු ඔහුගේ (පූරණකස්සපගේ) මතයයි. බ්‍රහ්මජාල සූත්‍රයෙහි අධිච්චසමුප්පන්න වාදය ලෙස දැක්වූයේ මෙයයි. 10 (10. අධිච්චසමුප්පන්න යන්නෙහි විරුද්ධ වචනය ' පටිච්චසමුප්පන්න ' යනුයි.)

### 2. මක්ඛලිවාදය

ආත්මය කිසියම් නියතියකට අනුව සසර සැරිසරා ශුද්ධියට පත්වේ යනුවෙන් උගන්වන්නේ මක්ඛලිවාදය යි. තිල – පුෂ්ප – ජීව යන මේවා මැරී – මැරී අධ්‍යාත්මය උපදනා සෙක් සියලු ජීවයෝ පරිවර්තනය වෙත්. කඨෝපනිෂද්හි ද, ශස්‍යමිව මර්ත්‍ය : පච්‍යතේ, ශස්‍යමිව ජායතේ පුන : (කඨෝප. 1.1.6) මක්ඛලිගෝසාලවාදය ජෛන භාගවතී සූත්‍රයෙහි පවුට්ටපරිහාරවාද නමින් දැක්වේ. සංසාරසුද්ධිවාද නමින් බෞද්ධ පොත්හි එයි. එයින් ප්‍රකාශ වන්නේ සත්ත්වයා තුළ ආත්මය කෙරෙහි කිසිදු බල පෑමක් කළ නො හැකි බවත්, ආත්මනියතියට අනුව සත්ත්වයා සසර සැරිසරා ශුද්ධියට පත්වන බවත්ය. 11 (11. දීඝනි. සීලක්ඛ. සාමඤ්ඤඵල. 40)

මෙයින් මක්ඛලිගෝසාල සම්පූර්ණයෙන් නියතිවාදියකු බව පැහැදිලි වේ. මනුෂ්‍යයාට නියමය වෙනස් කිරීමට බලයක් නැත. හොඳ නරක සියල්ල සිදුවන්නේ නියමය (නියතිය) අනුවයි. සංසාරය කිරා මැණ නියතියක් අනුව පවත්නේය. නුවණ හෝ පින් පව් හෝ ඇතත් නැතත් ඒ නියතියෙහි වෙනසක් නො වේ යනු මේ නියතිවාදයේ සාරාංශය යි.

### 3. අජිතකේසකම්බලවාදය

මෙය වනාහි (නාස්තික) උච්ඡේදවාදයයි. පායාසිරාජඤ්ඤයා තුළ ඇති වූයේ ද මෙ උච්ඡේද දෘෂ්ටිය වේ. 12 (12. දීඝනි. මහාව. පායාසිරාජඤ්ඤසු. 195) ජෛනඋපාඞ්ගසූත්‍රයක් වූ රාය පසෙනිසුය යනු ද පායාසිරාජඤ්ඤ සූත්‍රයමැයි. අජිතකේසකම්බල පිළිගන්නේ දසවත්ථුක මිථ්‍යා දෘෂ්ටියයි. 13 (13. දීඝනි. සීලක්ඛ. සාමඤ්ඤඵල. 42) මරණින් මතු පඨවි – ආපෝ – තේජෝ – වායෝ ධාතූන්ට ශරීරය එක් වීමෙන් මතු භවයක් ඇති නොවන බව අජිතකේසකම්බලගේ හැඟීමයි. භෞතිකවාදය නමින් හැඳින්වෙන්නේ ද මෙයමැයි.

### 4. පකුධකච්චායනවාදය

මෙය වනාහි සත්තකායවාද නමිනුදු හැඳින් වේ. මේ වාදයෙහි කියැවෙන සප්තකාය නම් : 1. පඨවි, 2. ආපෝ, 3. තේජෝ, 4. වායෝ, 5. සුඛෙ, 6. දුක්ඛෙ, 7. ජීවේ යන මේ සප්තක යයි. 13 (13. දීඝනි. සාමඤ්ඤඵල. සීලක්ඛ. 43) මේ සප්තකායෙහි සුඛ දුක්ඛ දෙක වෙනුවට සූයගඩඞ්ගයෙහි දැක්වෙන්නේ ආකාස – අත්ත දෙකයි. ජීවකායය සම්පූර්ණයෙන් අත්හැර දමා ඇත. එබැවින් සූයගඩඞ්ගය මෙය හඳුන්වන්නේ **ආත්මෂෂ්ඨවාද** නමිනි. මේ සප්තකායය කිසිවකු විසින් නො කරන ලදය, නො කරවනලදය. නො මවනලදය, නො මවවනලදය. එකිනෙකට සම්බන්ධ ද නැත. සෙලවීමක් පෙරළීමක් හෝ නැත. තියුණු කඩුවකින් කැපූ විට කපන්නෙක් හෝ කැපෙන දෙයක් හෝ නැත. කඩුව සප්තකායය අතුරෙන් ගමන් කෙරේ යනු ඔහුගේ ඉගැන්වීමයි. සූයගඩඞ්ග (සූත්‍රකෘතාඞ්ග) යෙහි **අකික්කවාද** නමින් හඳුන්වා ඇත්තේ ද මෙයයි.

### 5. සඤ්ජයබෙල්ලට්ඨිපුත්තවාදය

පරලොවක් ඇද්ද ? නැද්ද ? යන ආදින් කරන හැම ප්‍රශ්නයකදී ම, ඇතැයි අදහසකුත් මගේ නැත. නැතැයි අදහසකුත් මගේ නැත යන ආදීන් ඒකාන්ත පිළිතුරක් නො දීම සඤ්ජයබෙල්ලට්ඨි පුත්තවාදයයි. ආත්මය පිළිබඳව ද ඔහුගේ පිළිතුරු එ බඳුය. **අනෙකාන්තවාද** නමින් එය හැඳින්වේ. 14 (14. දීඝනි. සාමඤ්ඤ. සීලක්ඛ. 45)

### 6. නිගණ්ඨනාතපුත්තවාදය

**චාතුයාමසංවරය** 15. නිගණ්ඨනාථ පුත්තගේ ඉගැන්වීමයි. (15.1. සබ්බවාරිවාරියෝ, සබ්බ වාරියුතෝ, සබ්බවාරිධුතෝ, සබ්බවාරිඵුටෝ, 2. ගතත්තෝ (කොටිප්පත්තචිත්ත තාවයි) 3. යතත්තෝ (සංවරචිත්තතාවයි) 4. ඨිතත්තෝ (නිච්චලචිත්තතාවයි) ජෛනපොත්හි දැක්වෙන චාතු යාමසංවරය මෙයට වඩා වෙනස්ය. පාර්ශ්වනාථගේ චාතුයාමසංවරය මේ දෙක ම නොව අනෙකකි.)

නිගණ්ඨනාතපුත්ත ස්‍යාද්වාදියෙකි. ස්‍යාද්වාද යනු අනිශ්චිතවාදයයි. ස්‍යාද්වාදියා කිසිදු දෙයක් ඇත කියා හෝ නැත කියා හෝ නිශ්චිතව නො කියයි. උපනිෂද්හි හැමදෙයක ම නිත්‍යත්වයට ප්‍රධානත්වය දෙයි. බෞද්ධ දර්ශනයෙහි ප්‍රධානත්වය හිමි කරන්නේ හැමදෙයක ම අනිත්‍යත්වයටයි. වර්ධමානමහාවිර නිගණ්ඨනාතපුත්තගේ ජෛනදර්ශනය මේ දෙමතයෙහි ම මැද සිටගෙන නිත්‍යත්ව – අනිත්‍යත්ව දෙක ම පිළිගනියි. මැටිපිඩෙන් කළය සාදයි. මැටිපිඩ විනාශ විය. කළය උපදියි. එහෙත් ද්‍රව්‍යනයින් බලන කල එ හැමතැන ම ඇත්තේ මැටිද්‍රව්‍යයයි. ද්‍රව්‍ය වශයෙන් සර්වප්‍රකාර පරිවර්තනයක් හෝ අපරිවර්තනයක් ඔහු නො පිළිගනිති. එහෙත් පරිවර්තනශීලී ද්‍රව්‍යයෙහි අපරි වර්තන ස්වභාවයක් ද ඇත යනු ජෛනමතය යි.

### ආත්මදෘෂ්ටියෙහි ද්විවිධ මූලධර්ම

මේ තාක් අප ඉදිරිපත් කළ කරුණු අනුව විමසා බැලීමෙහි දී ආත්මය පිළිබඳ දෙයාකාර අදහසක් දක්ක හැකිය. එනම් : ඇතැම් අය ආත්මය නැති නොවන බැවින් සදාතන (ශාස්වත) වූවක් ලෙස පිළිගන්නා අතර සමහර අය ආත්මය විනාශයට පත් වන බැවින් උච්ඡෙද වූවක් ලෙස පිළිගන්නා බවයි ආත්මය පිළිබඳව ඇති වූ මේ දෙයාකාර අදහස ශාස්වතවාදය හා උච්ඡෙදවාදය ලෙස හඳුන්වනු ලැබේ· දෙසැටක් වූ දෘෂ්ටිවාද සියල්ල ම ගොඩනැගී ඇත්තේ ශාස්වත – උච්ඡෙද යන මේ ද්විවිධවාදයන් මතය·

### අනාත්මය

බුද්ධධර්මයෙහි දැක්වෙන අනාත්ම යන වචනය වෙත මීළඟට අපේ සිත් යොමු කරමු. කලින් දැක්වූ කරුණු අනුව ආත්මවාදය ලොව පුරා පැතිර යත් ම එයට විරුද්ධවාදයක් ඉදිරිපත් කරන ලද්දේ දඹදිව මධ්‍යදේශය ජන්මභූමි කොට ගත් සිද්ධාර්ථ ගෞතම තථාගතයන් වහන්සේ විසිනි. උන්වහන්සේගේ ලොව පහළ වීමට පෙරාතුව සිට ම යාග හෝමාදිය ගරු නො කරන පිරිසක් සිටි බව පිළිගැනීමට ද සෑහෙන පමණ කරුණු ඇත. ක්‍රි.පූර්ව සත්වැනි සියවස්හි දී පමණ යාගයක් කොට දේවත්වයට පැමිණිය හැකිය යන විශ්වාසය බ්‍රාහ්මණයන් තුළ විය. එබඳු යාග සඳහා නසනලද

සිවුපාවෝ බොහෝ වෙති. එහි කටයුතු සඳහා වැය කළ ධනය ද ඉමහත්ය. යාගයකදී බමුණනට ගෙවිය යුතු මිල ද, පරිත්‍යාග කළයුතු ගවමහිසාදීන්ගේ ගණන ද නියමිතව ඇත. එසේ මහත් ආයාස යෙන් කරවූ යාගයෙනුත් ඵල ලැබිය හැකි වූයේ වියදම් දැරූ එක් පුද්ගලයකුට පමණකි.

## ආත්මය විශ්වාස කළ හැකි ද ?

ආත්මවාදීහු ලොව මැවූ නිර්මාතෘවරයාත් ආත්මයත් දෙක ම සදතන ලෙසත් විශ්වාස කළහ. සදතන වූ, පටන්ගැන්මක් හෝ අවසානයක් නො මැති වූ ආත්මයකින් හටගත් සත්ත්වයා ද එසේ ම සදතන වූ ද නිත්‍ය වූ ද පුද්ගලයකු විය යුතු ය. එබඳු සත්ත්වයෝ ලෙව්හි නො වෙති. සවිඤානික – අවිඤානික සියල්ල විනාශයට යෙති. මෙසේ ඇති කල්හි සදතන ආත්මයක් හෝ දෙවියෙක් කොයින් ලැබේද ?

## ආත්මදෘෂ්ටිය ඇති වන්නේ කෙසේද ?

මම ය, මාගේ ය යි සිත්හි ඇති වන වැරැදි හැඟීම ආත්මදෘෂ්ටිය ඇති වීමට හේතුයි. මම ය, මාගේ ය යි ඇති වන දෘෂ්ටිය සැබෑ නම් මම ය කියා හෝ මගේය කියා සිතනු ලබන දෙය තමාගේ කැමැත්තට අනුවම පැවැතිය යුතුය. තමාගේ ජීවිතය වත් තමන් කැමැත්තට අනුව නො පවතී නම් බාහිර වස්තූන්ගේ එසේ නො පැවැත්ම ගැන කියනු ම කිම ?

## අනාත්මය

' මහණෙනි, ඇස අනිත්‍යය, යමක් අනිත්‍ය ද එය දුකය. යමක් දුක ද එය අනාත්මය. යමක් අනාත්ම ද එය මගේ නො වේ. මමත් නො වෙමි. එය මාගේ ආත්මය ද නො වෙය යි මෙසේ තත් වූ පරිදි සමයක් ප්‍රඥාවෙන් දතයුතු.' 16

(16) චක්ඛුං භික්ඛවෙ අනිච්චං, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා,
යදනත්තා තං නේතං මම, නේසෝහමස්මි, න මේ සෝ අත්තාති ඒවමේතං යථා
භූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. (සංයු. සළායතන සු. අනිච්චවව. 541)

මෙ දේශනාවෙන් අපට පැහැදිලි කර ගත හැකි ඉතා වැදගත් කරුණක් වෙයි. එනම් : අනිත්‍ය දෙය ම දුක් බවත්, දුක් දෙය ම අනාත්ම බවත්ය. අනිත් අතට එය මෙසේත් දැක්විය හැකිය. යමක් අනාත්ම නම් එය දුකය. යමක් දුක නම් එය අනාත්මය යනුවෙනි. එයින් පැහැදිලි වූයේ අනාත්ම වන දෙය ම දුක් වූ දෙයත්, අනිත්‍ය වූ දෙයත් වන බවයි.

## නිවණ ආත්ම ද ?

" සියලු සංස්කාරයෝ අනිත්‍යයහ ' යි යම් කලෙක විදසුන් නුවණින් දකින්නේ වේ ද, එකල මෙ ස්කන්ධ පරිහරණ දුඃඛයෙහි කලකිරීම නිර්වාණයට මාර්ගය යි." 17

(17) සබ්බේ සඞ්ඛාරා අනිච්චාති
යදා පඤ්ඤාය පස්සති,
අථ නිබ්බින්දතී දුක්ඛෙ
ඒසමග්ගො විසුද්ධියා. (ධම්මපද. මග්ගවග්ග)

" සියලු සංස්කාරයෝ දුක්ඛයහ 'යි යම් කලෙක නුවණින් දකී ද, එකල දුක්ඛයෙහි කලකිරෙයි. ඒ කලකිරීම නිර්වාණයට මාර්ගයයි." 18

(18) සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති,
යදා පඤ්ඤාය පස්සති,
අථ නිබ්බින්දති දුක්ඛෙ,
ඒසමග්ගො විසුද්ධියා. (ධම්මපද. මග්ගවග්ග)

" සියලු ධර්මයෝ අනාත්මයහ 'යි යම් කලෙක නුවණින් දක්නේ වේ ද, එකල මේ ස්කන්ධ පරිහරණ දුඃඛයෙහි කලකිරෙයි. ඒ කලකිරීම නිවණට මගයි." 19

(19) සබ්බෙ ධම්මා අනත්තාති
යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දති දුක්ඛෙ,
ඒසමග්ගෝ විසුද්ධියා. (ධම්මපද. මග්ගවග්ග)

මෙහි දැක් වූ ' සබ්බේ සඞ්ඛාරා අනිච්චා, සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා, සබ්බෙ ධම්මා අනත්තා.' යන ත්‍රිලක්ෂණය ගෙන විමසා බැලිය යුතුයි. මෙහි ' සඞ්ඛාරා ' යන වචනයෙන් සෙයින් ම ' ධම්මා ' යන වචනයෙන් ද පඤ්චස්කන්ධය ම අර්ථකථාව කියයි. 20 ((20) තත්ථ සබ්බෙ ධම්මාති පඤ්චක්ඛන්ධාව අධිප්පේතා. ධම්මපදට්ඨ. 675) සඞ්ඛාරා යන්නෙන් ප්‍රත්‍යයෝත්පන්න සංස්කාර ධර්ම යන් පමණක් කියැවෙන බවත්, ධම්මා යන්නෙන් එබඳු සංස්කාර ධර්මත් එසේ නො වූ අසංස්කාර සෙසු ප්‍රඥප්තිධර්ම ආදියත් පැවැසෙන බව සැලකිය යුතුය. අසංස්කාර වූ නිවණත් එයට ම අයත් වන සැටි සියුම් ලෙස ඉවසීමෙන් යුතුව විමසා බලා දැනගත යුත්තකි.

මේ පිළිබඳව විමසා බැලීමෙහිදී සංයුත්තනිකායයෙහි ඛන්ධසංයුත්තයේ පුප්ඵවග්ගයෙහි එන මේ පාඨය ද සලකා බැලීම ප්‍රයෝජනවත්‍ය යි සිතමි. එනම් : " මහණෙනි, මෙ කරුණෙහි ලා තෙපි කෙසේ සිතවු ද ? රූපය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍යය.
යමක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද ? සැප හෝ වේ ද ?
වහන්ස, දුකය.

යමක් අනිත්‍ය වේ නම් දුක් වේ නම් විපරිණාම ස්වභාව වේ නම් එය 'මෙය මගේය, මෙතෙමෙ මම වෙමි 'යි මෙය මාගේ ආත්මය 'යි ගන්නට නිසි වේ ද ?

වහන්ස, එසේ ගන්නට නිසි නොවේ. 21 (තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති ? අනිච්චං භන්තේ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති ? දුක්ඛං භන්තේ. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලංනු තං සමනුපස්සිතුං, ඒතං මම, ඒසෝහමස්මි, ඒසෝ මේ අත්තාති ? නෝහේතං භන්තේ. සංයු. 441)

මෙයින් පැහැදිලි වන්නේත් කලින් දැක්වූ පරිදි යමක් අනිත්‍ය නම් එය දුක බවත්, යමක් අනිත්‍ය – දුක්ඛ – විපරිණාමස්වභාව ඇත්තේ නම් එය තමන් වසහයෙහි නො පවත්නා (අවසවර්ති) හෙයින් අනාත්ම බවත්‍ය.

සබ්බෙ ධම්මා අනත්තා යන තන්හි අසඞ්ඛාරධර්ම වූ නිවණත්, අනාත්මය යි ගැනේ නම් " යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා 'යි යමක් අනිත්‍ය ද, එය දුකය. යමක් දුක ද, එය අනාත්මය " යි දැක්වූ දේශනා නිගමනය නිරර්ථක වේ ද, ' සබ්බෙ ධම්මා අනත්තා ' යන තන්හි සංස්කාරධර්මත්, ප්‍රඥප්තිධර්මත්, අසංස්කාරධර්ම සඞ්ඛ්‍යාත නිර්වාණයත් අනාත්මය යි ගත හොත් සිදුවන වරද කුමක් ද ? එය මෙසේ විමසන්න.

(අසංස්කාරධර්ම සඞ්ඛ්‍යාත) නිබ්බාණය අනාත්මය. නිබ්බාණය අනාත්ම නම් නිබ්බාණයත් දුක් ද විය යුතුය. අනිත්‍ය ද විය යුතුය. යමක් අනිත්‍ය නම් එය දුකය. යමක් දුක නම් එය අනාත්මය යි දැක්වූ න්‍යායය ම ප්‍රතිලෝම ක්‍රමයෙන් ගත් කල යමක් අනාත්ම නම් එය දුකය. යමක් දුක නම් එය අනිත්‍යයයි ගැනීම තර්කයෙහි ම බැසගත් අයට නම් සත්‍යයක් වනු ඇත.

## නිර්වාණය අනාත්මධර්මයකි

එහෙත් අනිත්‍ය වූ සියල්ල දුක් වෙතත්, අනාත්ම වූ සියල්ල දුක්ය කියා හෝ සැපය කියා හෝ ගැනීමට නො හැකි වේ. ප්‍රතිලෝම තර්කය බිඳ වැටෙන්නේ එතන්හිය. නිර්වාණය දුකක් නො වන්නා සේ ම වේදයිත සුඛයක් ද නො වෙයි. එය වේදයිත සුඛයක් නම් වේදනාස්කන්ධයට වැටෙයි. පඤ්චස්කන්ධයට ම අයත් වූ වේදනාස්කන්ධය ද අනිත්‍ය, දුක්ඛ, අනාත්ම බව පළමු ව

කියා ඇත. එබැවින් අසඞ්ඛාරධම්ම සඞ්ඛ්‍යාත නිර්වාණය වේදයිත වූ සුඛ - දුක්ඛ දෙකින් ම විනිර්මුක්ත ධර්මයකි. එහෙයින් ප්‍රතිලෝම තර්කයට බැසගෙන නිර්වාණය අනාත්ම බැවින් නිර්වාණය දුක් විය යුතු ය යි ගෙනෙන තර්කය. තර්කයට කෙසේ වුවත් ධර්මයට නො ගැළපෙයි. නිබ්බාණය අතක්කාවචර වූයේත් මෙසේ ධර්මයට තර්කය නො සැසඳෙන තැන් ඇති හෙයින් ම බව මෙහි ලා සැලකිය යුතුය.

## අවසවත්තිත්තා අනත්තා

බුද්ධධර්මයෙහි අනාත්මධර්මය පැහැදිලි කළේ ' අවසවත්තිත්තා අනත්තා ' යනුවෙනි. තමන් වශයෙහි නො පවත්නා යමක් ඇද්ද එය අනාත්ම වේය යනු එහි අදහසයි. මෙහි දී පැනනගින තර්කය නම් නිවණ තමන් වශයෙහි නො පවත්නා පඤ්චස්කන්ධධර්මයන් බඳු වූ ම එකක් ද යන්නයි. පඤ්චස්කන්ධධර්මයන් තමන් වශයෙහි නො පවත්නා බැවින් අනාත්ම වූ සැටියෙහිත්, නිබ්බාණ ධර්මය අනාත්ම වූ සැටියෙහිත් විශාල වෙනසක් ඇති බැවින් එය ද විවේකයෙන් ඉවසිල්ලෙන් සිතා තේරුම් ගත යුතු වෙයි.

ස්කන්ධ සහිත වනුයේ ප්‍රඥප්තියට අනුව පුද්ගලයෙකි. අනිත්‍ය වූ දුක් වූ ස්කන්ධයන් තමන් වශයෙහි පවත්වා ලිය නො හෙන බැවින් පුද්ගලයාට ස්කන්ධධර්ම අවසවර්ති වෙයි. නිර්වාණය පුද්ගල ප්‍රඥප්තිය දුරුකළ ධර්මයකි. ස්කන්ධ විනිර්මුක්ත තත්ත්වයකි. එහි ස්කන්ධයන්වත්, ස්කන්ධහේතුවෙන් හටගත් පුද්ගල ප්‍රඥප්තියක්වත් කැලැම නැත. අනිත්‍ය - දුක්ඛ ලක්ෂණ යුක්ත ස්කන්ධයන්වත්, ස්කන්ධහේතුවෙන් හටගත් පුද්ගල ප්‍රඥප්තියක්වත් නැති නිවණ මමය මාගේයයි ගැනීමට නිසි කිසිත් නැති තත්ත්වයකි. එහි මමය මාගේයයි ගැනීමට නිසි කිසිත් නැත්තේ තමන් වශයෙහි නො පවත්නා අවශවර්තිත්වය නිසා නොව සත්ව පුද්ගල ප්‍රඥප්තීන් අභාවයට ගිය නිසා බව තේරුම් ගත යුතුය. තමන්ය යි ගතයුතු දෑයක් වත් නිවණෙහි නැත් නම් එහි ආත්මය යි ගත හැකි කිසිවක් විය නො හැකිය. අසංස්කාර නිබ්බාණය පිළිබඳ ' අනත්තා ' යන්නෙහිත්, සංස්කාර ධර්මයන් පිළිබඳ ' අනත්තා ' යන්නෙහිත් විවිධාර්ථවත් බව එසේ තේරුම් ගත යුතුය.

## විමසා බැලිය යුතු තැන්

" උපයෝ හි ධම්මේසු උපේති වාදං
අනූපයං කේන කථං වදෙය්‍ය
අත්තං නිරත්තං න හි තස්ස හෝති
අධෝසි සෝ දිට්ඨීමිධෙව සබ්බං.'' (සුත්තනිපාත. දුට්ඨට්ඨක. 95)

තෘෂ්ණා - දෘෂ්ටීන් ඇසුරු කළ බැවින් ' උපය ' නම් වූ පුහුදුන් තැනැත්තේ රාගරක්තයෙක ද්වේෂදුෂ්ටයෙක යන ආදීන් කීමට සුදුසු වෙයි. තෘෂ්ණා - දෘෂ්ටි ප්‍රහාණය කළ බැවින් ' අනූපය ' නම් වූ ක්ෂීණාශ්‍රවයාහට කවර රාගයකින් ද්වේෂයකින් රක්තය දුෂ්ටය යි කෙසේ කියන්නේද ? ඒ රහත්හට ආත්ම - නිරාත්ම දෘෂ්ටි නැත. හේ ඒ සියලු දෘෂ්ටිවාද හළේය. මෙහි එන අත්ත - නිරත්ත වචනයන් විමසා බැලිය යුතුය. රහත්හට අත්ත - නිරත්ත දෘෂ්ටි නො වන බව එයින් කියැවේ. එහෙයින් නිවන ආත්මන් ද නො වේ. නිරාත්මන් ද නො වේයයි සිතීමට එහි අවකාශයක් ඇත.

ශාස්වත - උච්ඡේද වාද සියල්ලට ආත්මවාදය පදනම්ව ඇති සැටි අප පළමු ව කියා ඇත. ඒ බාහිරකයන් ගත් ආත්මය බඳු ආත්මයක් නිවණ පිළිබඳව නොමැති බැවින් නිවණ ආත්මධර්මයෙක යන දෘෂ්ටියකට වැටෙනු බැරිය. රූපාදි ස්කන්ධ ධර්මයන් සේ අවශවර්තීව පවත්නා දෑයක් හෝ ප්‍රඥප්ති වශයෙන් පෙන්විය හැකි පුද්ගලත්වයක් නිවණ පිළිබඳව නො වන බැවින් නිවණෙහි නිරාත්මතාව ඇතැයි ගත් දෘෂ්ටිවාදයකුදු නො එයි. ඒ ආත්ම - නිරාත්ම දෘෂ්ටි දෙක ම ඇති නො වන්නේ රහත්නටය. ස්කන්ධධර්මයන්හි කී අනාත්මතාව බඳු අනාත්මතාවක් නිවණ පිළිබඳව නොමැති බව මෙතෙක් දක්වූ කරුණු අනුව අනාවරණය කර ගත යුතුය. ස්කන්ධ හා ප්‍රඥප්තීන් හා සම්බන්ධ නො වූ බාහිරකයන් කියන ආත්මය බඳු එකකුත් නිවණෙහි නො වන බැවින් නිවණ පිළිබඳව ඇති අනාත්මතාව කෙබඳු දැයි මෙයින් පැහැදිලි විය යුතුය.



3—A 081356